GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

18-06-2014

## මාධ්‍ය නිවේදනය

### අමාත්‍ය තොන්ඩමන්ගේ බලපෑම් නිසා නුවරඑළිය සෞඛ්‍ය සේවය අණතුරේ!

පසුගිය 13 වන දින කොටගල පැවති රැස්වීමකදි අමාත්‍ය තොන්ඩමන් මහතා කොටගල වෛද්‍ය නිලධාරිවරයාට බැන වැදි තර්ජනය කල අතර, ඉන් පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය අසල වතු ජනතාව උසිගන්වා කලබලකාරි තත්ත්වයක් ඇති කරන ලදි.

ඉන් පසු රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මැදිහත් වීමත් සමග ඇති වු තත්ත්වය පිළිබඳව ගරු සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රිපාල සිරිසේන අමාත්‍යතුමා සමග සාකච්ඡාවක් පවත්වන ලදි. එහිදි ඉදිරියේදි නුවරඑළිය දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය කටයුතු කරගෙන යාමේදි වෛද්‍යවරුන්ට දේශපාලන බලපෑම් වලින් තොරව රාජකාරි කටයුතු කිරීමේ නිදහස ආරක්ෂා කළ යුතු බව සෞඛ්‍ය අමාත්‍යතුමාද පිළිගත් අතර තොන්ඩමන් ඇමතිවරයා සමග සාකච්ඡා කොට මේ තත්ත්වය නිරාකරණයට මැදිහත් වන බව දැනුම් දෙන ලදි.

නමුත් තොන්ඩමන් අමාත්‍යවරයා දිගින් දිගටම අත්තෝනෝමතික තිරණයක සිට මෙම වෛද්‍යවරයා ඉවත් කල යුතුය යන මතයේ කටයුතු කිරීම හේතුවෙන් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය අද දින නුවුර එළිය දිස්ත්‍රික්කයේ සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ වල වෘත්තිය සිමිති ක්‍රියාමාර්ගයක නිරත වීමට සිදු විය.

මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් නොලද හොත් හෙට දිනයේ ද මේ වෘත්තිය සිමිත ක්‍රියාමාර්ගය අඛණ්ඩව කරගෙන යාමටද, හෙට දින පැවැත්වීමට නියමිත විධායක කමිටු රැස්වීමේදි සාකච්ඡා වන පරිදි ඉදිරියේදි මුලු නුවරඑළිය දිස්ත්‍රික්කයටම බලපාන ලෙස වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය ව්‍යාප්ත කිරීමටද බලාපොරොත්තු වෙමු.

පසුගිය වසර 03 පුරා එකදු මාතෘ මරණයක් හෝ වාර්ති නොවු කොටගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාෂයේ හා නුවර එළිය දිස්ත්‍රිකකයේ සිදු වන රෝග නිවාරණ කටයුතු වල බිඳවැටීම් වලට අමාත්‍ය තොනඩමන් සම්පුර්ණයෙන් භාර ගත යුතු බවද අවධාරණය කර සිටිමු.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර වෛද්‍ය සිඳත් විජේසේකර 0772004397
වෛද්‍ය හරිත අලුත්ගේ 0718121619